11
පාඩම
एकादशः पाठः

# ජය ගන්න; කියවන්න

ප්‍රාර්ථනාර්ථ ක්‍රියාපද (लोट्) ලකාරය
(මධ්‍යම පුරුෂ)

सत्यं वद, धर्मं चर ।

(ඇත්ත කියන්න, ධර්මයෙහි හැසිරෙන්න.)

| | | | | | |
|---|---|---|---|---|---|
| नमसि | - | වඳිහි | नम (हि) | - | වඳින්න |
| विनयसि | - | හික්මෙහි | विनय (हि) | - | හික්මෙන්න |
| लभसि | - | ලබහි | लभ (हि) | - | ලබන්න |
| खसि | - | නාද කරහි | ख (हि) | - | නාද කරන්න |
| पठसि | - | පාඩම් කරහි | पठ (हि) | - | පාඩම් කරන්න |
| चरसि | - | හැසිරෙහි | चर (हि) | - | හැසිරෙන්න |
| वारयसि | - | වළක්වහි | वारय (हि) | - | වළක්වන්න |
| पोषयसि | - | පෝෂණය කරහි | पोषय (हि) | - | පෝෂණය කරන්න |
| रञ्जयसि | - | පාට කරහි | रञ्जय (हि) | - | පාට කරන්න |
| देशयसि | - | දේශනා කරහි | देशय (हि) | - | දේශනා කරන්න |
| वदसि | - | කියහි | वद (हि) | - | කියන්න |
| बोधयसि | - | අවබෝධ කරහි | बोधय (हि) | - | අවබෝධ කරන්න |

සාදාගන්නා ක්‍රමය :-

| | | | |
|---|---|---|---|
| भवसि | - | भव~~सि~~ | - भव |
| नमसि | - | नम~~सि~~ | - नम |
| वदसि | - | वद~~सि~~ | - वद |
| लभथः | - | लभ~~थः~~ | - लभतम् |
| विनयथः | - | विनय~~थः~~ + तम् | - विनयतम् |
| देशयथः | - | देशय~~थः~~ + तम् | - देशयतम् |
| चलथ | - | चल~~थ~~ + त | - चलत |
| प्रविशथ | - | प्रविश~~थ~~ + त | - प्रविशत |
| वारयथ | - | वारय~~थ~~ + त | - वारयत |

මේ වාක්‍යවල මධ්‍යම පුරුෂ ලෝට් ප්‍රාර්ථනාර්ථ පද යෙදී ඇති අයුරු වටහා ගන්න.

१. त्वं लोकं जय। — නුඹ ලොව ජයගන්න.
युवां श्लोकं पठतम्। — නුඹලා දෙදෙන ශ්ලෝකය කියහුවා!
यूयं सत्यं वदत। — නුඹලා සත්‍යය කියහුවා!

२. त्वं सुमित्राणि भज। — නුඹ යහපත් මිතුරන් ඇසුරු කරන්න.
युवां कार्याणि कुरुतम्। — නුඹලා දෙදෙන කටයුතු කරහුවා!
यूयं सम्यक् शिष्यान् रक्षत। — නුඹලා මනාකොට ශිෂ්‍යයන් රකිහුවා!

३. त्वं पितरं प्रसीद। — නුඹ තාත්තාව පහදවන්න.
युवां पूज्यान् पूजयतम्। — නුඹලා දෙදෙන පිදිය යුත්තන් පුදහුවා!
यूयं अनृतं मा वदत। — නුඹලා බොරු නො කියහුවා!

## 11.1 අභ්‍යාසය

වර්තමාන (ලට්) මධ්‍යම පුරුෂ වචනත්‍රය සඳහා ප්‍රාර්ථනාර්ථ ලෝට් මධ්‍යම පුරුෂ වචනත්‍රය සාදන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උදාහරණ :- | वदसि | - | (කියයි) | वद | - | (කියන්න) |
| | वदथः | - | (දෙදෙන කියහු) | वदतम् | - | (දෙදෙන කියහුවා) |
| | वदथ | - | (කියහු) | वदत | - | (කියහුවා) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| १. | गायसि | - | (ගයයි) | ............ | - | (.........................) |
| | गायथः | - | (......................) | ............ | - | (.........................) |
| | गायथ | - | (......................) | ............ | - | (.........................) |
| २. | जीवसि | - | (ජීවත් වෙයි) | ............ | - | (.........................) |
| | जीवथः | - | (......................) | ............ | - | (.........................) |
| | जीवथ | - | (......................) | ............ | - | (.........................) |
| ३. | नयसि | - | (ගෙනයයි) | ............ | - | (.........................) |
| | नयथः | - | (......................) | ............ | - | (.........................) |
| | नयथ | - | (......................) | ............ | - | (.........................) |
| ४. | जानासि | - | (දැනගනියි) | ............ | - | (.........................) |
| | जानाथः | - | (......................) | ............ | - | (.........................) |
| | जानाथ | - | (......................) | ............ | - | (.........................) |
| ५. | लिखसि | - | (ලියයි) | ............ | - | (.........................) |
| | लिखथः | - | (......................) | ............ | - | (.........................) |
| | लिखथ | - | (......................) | ............ | - | (.........................) |

## 11.2 අභ්‍යාසය

මධ්‍යම පුරුෂ සර්වනාම පදත්‍රය සඳහා ගැලපෙන ලෝට් ප්‍රාර්ථනාර්ථ පද යා කරන්න.

| | |
|---|---|
| त्वम् | देशयतम् |
| | लिखत |
| | पिब |
| | रक्षत |
| | पश्य |
| युवाम् | लभतम् |
| | तिष्ठतम् |
| | दर्शय |
| | स्मरतम् |
| यूयम् | त्यज |
| | कुरुत |

## 11.3 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නගන්න.

१. त्वं कूपात् जलं आहर ।
२. यूयं सत्यं वदत ।
३. युवां विहारं गच्छतम् ।
४. त्वं क्रीडाङ्गणे सम्यक् क्रीड ।
५. वत्स, पितरं प्रणम ।
६. रेवत, त्वं सम्यक् धर्मं पठ ।
७. बालकाः चन्द्रं पश्यन्तु ।
८. नेतारौ राज्यं जयताम् ।
९. यूयं प्रतिदिनं परिवेणं आगच्छत ।
१०. भूपतयः सर्वदा प्रजां धर्मेण रक्षन्तु ।

## 11.4 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අකුරින් ලියන්න.

1. අම්මා ආහාර උයාවා!
2. නුඹ ධර්මයෙන් ජීවිතය දිනන්න.
3. ඔබ වහන්සේලා දෙනම ධර්ම ශාලාවට වඩිහුවා!
4. ළමයි පොත් පාඩම් කරත්වා!
5. සියලු පාලකයෝ යුක්තිගරුක වෙත්වා!
6. ගස් පල දරාවා!
7. පුත්තු දෙදෙන සිය මව සනසත්වා!
8. සැමදා විරුවන් සමරන්න.
9. දිවා රෑ පින් කරන්න.
10. නුඹලා සත්‍යය පවසහුවා!

## 11.5 අභ්‍යාසය

1. දී ඇති හැඩතල ගළපන්න. ප්‍රාර්ථනාර්ථ ලෝට් ක්‍රියාපද ලියා අර්ථය ලියන්න.



| පදය | අර්ථය |
|---|---|
| ........................................ | .................................................. |
| ........................................ | .................................................. |
| ........................................ | .................................................. |
| ........................................ | .................................................. |
| ........................................ | .................................................. |
| ........................................ | .................................................. |
| ........................................ | .................................................. |

2. ඉහත දී ඇති හැඩතල යොදා ගනිමින් ප්‍රාර්ථනාර්ථ ලෝට් ලකාර පරස්මෛපද පුරුෂත්‍රයේ සහ වචනත්‍රයේ වරනගා ලියා දක්වන්න.

### ලෝට් ලකාරය පරස්මෛපදය

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | ............................ | ............................ | ............................ |
| मध्यमपुरुष | ............................ | ............................ | ............................ |
| उत्तमपुरुष | ............................ | ............................ | ............................ |

## උපකාරක පද

නාමපද

युक्तिगरुक - යුක්ති ගරුක

ක්‍රියාපද

स्मरति - සිහි කරයි

භාවිතයට

त्यज दुर्जन संसर्ग
भज साधु समागमम् ।
कुरु पुण्यमहोरात्रं
स्मर नित्यमनित्यताम् ॥

දුර්ජනයන් හා එක්වීම අත් හරින්න. සත්පුරුෂයන් ඇසුරු කරන්න. දිවා රෑ පින් කරන්න. නිතර අනිත්‍යතාව මෙනෙහි කරන්න.